# ඔබ එංගලන්තයට එනවා නම් මෙය හොඳින් කියවා තේරුම්ගන්න!
# IF YOU ARE COMING TO THE UK, READ THIS CAREFULLY!

## New UK Immigration Process
## The New Points Based System

Australian style, Points based System was introduced by the United Kingdom Border Agency recently. It is said to replace more than 80 immigration routes to the UK. The news system is modern and is said to strengthen the immigration system. Under the new system there are 5 tiers through which individuals can apply to come to the UK.

### Tier 1

This Tier covers highly skilled individuals who contribute to growth and productivity. Sub category " General" covers highly skilled immigrants who could either be employed or self-employed. Second sub category " Entrepreneurs" includes those who have £2000,000 to invest in the UK, the third being " Investors" and are people who are looking to invest more than £1 million in the UK. The last sub category is those who qualify as (Post Study Work) migration.

### Tier 2

This tier will cover skilled workers with a job offer from a UK employer who has been licensed by the UKBA. Only those jobs that are considered to be in short supply are expected to be filled in this category. The employer must have been included in the National Sponsors' Register. They can issue a Certificate of Sponsorship in this category. In addition to skilled workers sports people, ministers of religion and intra company transfers do come under this category.

### Tier 3

This tier is presently suspended and is expected to cover low skilled workers with job offers to fill gaps in the UK labour force.

### Tier 4

Overseas adult / child students who come to the UK for studies and training will come under this category. They will need to be supported by educational institutions that are licensed by the UKBA. Rigorous quality checks are being carried out prior to licensing of such educational institutions. It is a good idea for prospective students to check the registration of Colleges before they part with their money. Only Colleges who are on the UKBA register can issue visa letters to prospective students for entry clearance from their home country.

### Tier 5

Youth Mobility and temporary workers come under this category. Those who come to UK for non-economic reasons such as charity workers, religious workers (non pastoral) temporary workers in creative and sports. Government authorised exchanges, international agreements and including TWES will be under this category.

♦ **Colvin L. De Silva**
**Immigration Advisor**
**Colvindesilva121@btinternet.com**


# ඇතුවත් බැරි නැතුවත් බැරි මොබයිල්



**රා**ජ්‍ය පාරිභාෂික වාග් මලාවේ Telephone යන්නට **දුරකතනය** කියාද Mobile යන වචනයට ජංගම කියාද යෙදී ඇත. ජංගම යන වචනය ගමනේ යෙදෙන එකතැනක නොසිටින යන අර්ථය ගෙන දෙන බව මට සිතේ. එබැවින් එය භාවිතයට පහසුය. කටට හුරුය. දැන් එය ශ්‍රී ලංකාවේ කාගේත් කටට හුරුවූ වචනයකි. මොබයිල් ටෙලිපෝන් යන්න ඉතාම කෙටිවී දැන් කවුරුත් එය අමතන්නේ මොබයිල් එක කියාය. එහෙත් තවමත් ඒ සඳහා ශ්‍රීලංකාවේ භාවිතා වන්නේ **සෙල්ටෙල්** නැත්නම් **සෙල් එක** කියායි. එයට හේතුව ලංකාවට මොබයිල් මුල්වරට හඳුන්වා දෙන ලද්දේ **සෙලියුලර් ටෙලිපෝන්** නම් සමාගමක් මගිනි. ඒ සමාගම ප්‍රචාරක කාර්යයන් සඳහා තම නාමය **සෙල්ටෙල්** යනුවෙන් කොට කළේය. එවක් පටන් මොබයිල්පෝනය ලංකාවේ සෙල් ටෙල් එක වීය. සමහරු එයට හැන්ඩ්පෝන් එක කියාද කියති. ගෙදර සවිකර ඇත්තේ **Land Phone** අතේ ගෙන යන්නේ **Hand Phone.** ඒ නමද නරක නැත.

මෙම ජංගම දුරකතන වර්ග කෝටි ගණනක් අද විවිධ නම්වලින් ලොව පුරා භාවිතා කෙරේ එය වයස් සීමාවක් නැතිව අද කාගේත් සුරතලා බවට පත්ව ඇත. මොබයිලයක් නැත්නම් ජීවිතයක්ද නැත යන තරමට ජනතාව එයට ඇබ්බැහිව ඇති සැටි පෙනේ. බස්රියක, දුම්රියක, වෙනත් ප්‍රසිද්ධ ස්ථානයක පමණක් නොව පන්සලක, පල්ලියක පවා මොබයිල් කරදරයෙන් බේරුමක් නැත. මොබයිලයට කතාකරන සමහරුන්ට මේ ලෝකය ගැන මතකක් නැත. කාන්තාවෝ තම අත්බෑගයන් අමතකව දමා මොබයිලයට කතාකරමින් බසයෙන් බැස යති. මෙය මා නිතර දැක ඇත

මොබයිල් මුල්වරට එංගලන්තයට ආ කාලය මට මතකය. ඒ දැනට අවුරුදු 22 කට පමණ පෙරය. ඒකාලයේ මොබයිල් පෝනයක් ලොකු ගැඩොල් කැටයක් තරම් විශාලය. ඉන් පහරදුන හොත් කෙනෙකු මැරී වැටෙන්නට පුළුවන. රාත්තල් තුනක් විතර බරය. එදා එයින් හැතැප්ම දෙකකට වඩා ඈතට කතාකළ නොහැකිය. එහෙත් අද මොබයිලයක් ඇඟිලි විස්කෝතුවක් තරම් කුඩා වන



අතර ලෝකයේ ඕනෑම තැනකට ඇමතිය හැක. ඉන් ගත හැකි වැඩ සීයකි. පොටෝ ගැහිලි, සංගීතය, කැලැන්ඩරය, බැංකු ගිණුමේ විස්තර, අන්තර් ජාලය ඔය ආදී කාර්යයන් මොබයිලයට පවරා ඇත.

මොබයිලය නැත්නම් අද ලෝකය සමග සම්බන්ධ වන්නට බැරිය. වෙනදා අපට පුරුදුව තිබූ සාමාන්‍ය දුරකතනය ඉක්මන් මිදිය. අද ලොව පුරා ගනුදෙනු වෙළදාම හා මිනිස් සබඳතා ආදියට මොබයිලය නැතුව බැරිය. වෙළෙන්දා මාළු විකුණන්නා රියැදුරා කම්කරුවා පමණක් නොව ශ්‍රීලංකාවේ පොල්කඩන අය පවා පොල්ගහේ මැදක් දුර ගොස් මොබයිලය පාවිච්චි කරති.

ජංගම දුරකතනය කොතරම් ජනතාවට හුරුවී ඇත්දැයි කිවහොත් ගෙවල්වල ඇති පරණ දුරකතනය වදිනවා ඇහෙන්නේ කලාතුරකිනි. එයට කතා කරනවාට වඩා මොබයිලය ෂුවර්ය. පුද්ගලයා හිරකූඩුවේ සිටියත් අල්ලා ගතහැකිය. අපේ යාළුවන් බොහෝ දෙනා බොහෝවිට කියන්නේ "මචං මගේ මොබයිල් එකට කෝල් එකක් දීපන් " යනුවෙනි. එසේ කීවත් සමහරු මොබයිලයට කතාකරන්නට කැමති නැත. මක්නිසාද එයට ලොකු ගණනක් කතාකරන කෙනාට අය වන බැවිනි. තරුණ ළමයින් දිගට හරහට මොබයිල් මගින් නොනවත්වා කතාකරනු දැකිය හැකිය. උන්ට ගතවන කාලය ප්‍රශ්නයක් නොවන්නේ



ඒවායේ බිල් ගෙවන්නේ උන්ගේ දෙමාපියන් බැවිනි.

මොබයිලය නිසා සමහරුන් කරදරයට ද පත්වන අවස්ථා ඇත. බසයක යද්දී එක් තැනැත්තෙක් දිගටම ශබ්ද නගා මොබයිලයෙන් කතාකරමින් කාටද බනිමින් යද්දී එය අසා සිටින්නට බැරිවූ ළඟ සිටි මගියා "නවත්තනව ඕයි ඔය මගුල අපට කනක් ඇහිල මේකෙ යන්න." යයි කීය. අවසානයේදී එය ගුටි බැට හුවමාරුවකට හැරිණ. බසය නවත්වන්නට හා පොලීසිය ගෙන්වන්නටද සිදුවිය. මා ඇතුළු බසයේ සිටි කාටත් එම කළබලයේ විසඳීමක් වන තුරු පාර අයිනේ රස්තියාදුවන්නට සිදුවීම මට මතක්වන්නේ සිනාවක් ද සමග ය. මේ සිද්ධිය මා අත්දුටුවේ මෑතක ශ්‍රීලංකාවට ගිය විට වේයන්ගොඩ හරියේ දී ය.

තව අවුරුදු දෙක තුනකින් මොබයිලයේ ස්වභාවය කෙබඳු වේදැයි අපට හිතාගන්නටවත් බැරිය. මොබයිලය ගැන තවත් කොටසක් ලබන කලාපයෙන් ඔබ හමුවට ගෙනෙන්නෙමි.

♦ **විල්ප්‍රඩ් පෙරේරා Berkshire UK**



# ඉන්දියාව කිසිදා අපේ මිතුරෙකු නොවීය, නොවේ.

**අ**පට කිට්ටුම රට ඉන්දියාව බව කවුරුත් දන්නවා. ඒත් කොච්චර දුරද කියලා හුඟ දෙනෙක් හිතලා නැහැ. වැල්වැටිතුරේ ඉඳලා මම අහල තියන විදියට හැතැප්ම **14** යි. අහංගම ඉඳලා වැලිගමට තියන දුර වගේ. බස් එකකින් ගියොත් විනාඩි **20** කින් යන්න පුළුවන්. ඉස්සර ප්‍රභාකරන්ගෙ වයසේ වැල්වැටිතුරේ, යාපනේ හිටි දෙමළ තරුණයො, මාළු අල්ලන මිනිස්සු බෝට්ටුවලින් ඉන්දියාවෙ මදුරාසියට ගිහිං, එම්.ජී.ආර්.ගෙ පික්චර් **9.30** ෂෝ එක බලල, එදා රෑම ආපහු එන බව මම අහලා තිබුණා. ඒක කවුරුත් දැනගෙන හිටි දෙයක්. මම මේ කිව්වෙ ඉන්දියාව ලංකාවට කොච්චර කිට්ටුද කියන එක පෙන්නන්න.

ඊළඟට අපි සංස්කෘතික වශයෙනුත් සෑහෙන කිට්ටුවෙන් ඉන්නෙ. ශරීර වර්ණයෙන්, කන කෑම බීම, යොදන තුනපහ, වැවෙන පළතුරු, එළවළු ආදී මේ හැම දෙයක්ම පාවිච්චි කිරීම අතින් අපි එකම විදියයි. තිස්තුන් කෝටියක් දෙවි ගොල්ලන්ට බාරහාර වීම, පුදපූජා පැවැත්වීම අපට කෙලින්ම ඉන්දියාවෙන් බෝවෙච්ච දෙයකි. ඒ සේරටම වැඩිය අපේ රට ඉහළින් අදහන ආගමික ශාස්තෘන් වහන්සේගේ උපන් භූමිය ඉන්දියාව. ඒ අතින් බැලුවහමත් ඉන්දියාවට අපේ තියෙන්නෙ ලොකු ගෞරව සම්ප්‍රයුක්ත බැඳීමක් සහ හිතවත්කමක්.

මම මේ දේවල් කිව්වෙ ඉන්දියාව සමග අපේ තියන සමානකම පෙන්වන්න. ඒවුනාට මෙන්න මෙහෙම ප්‍රශ්නයකුත් අපි අපෙන්ම අහන්න ඕන. මෙච්චර සමානකම් තිබුනත් ඇත්තටම අපි ඉන්දියාව ගැන දන්නවද කියලා. පිළිතුර **නෑ** කියන එක. අපි ඉන්දියාව ගැන ඇත්තටම දන්නෙ නෑ. අපි හිතාගෙන ඉන්න ඉන්දියාව නෙවෙයි ඒ තියෙන්නෙ. රටක් කිව්වම අපි කතා කරන්නෙ රටේ තියන ගස් කොළන් ගැන, භූ විෂමතා ලක්ෂණ ගැනම පමණක් නෙවෙයි, ඒ රටේ ඉන්න මිනිස්සු ගැන. ඒ රටේ ආණ්ඩුව ගැන. ඒ ආණ්ඩුව ක්‍රියාත්මක කරන මිනිස්සු ගැන. ඒ නයින් බලද්දි ඇත්තට එහේ මිනිස්සු ක්‍රියා කරන්නෙ කොයි විදියද කියලා අපට හිතාගන්න බෑ. ඒත් අපි හිතිය යුතුයි.

බුදුන් වහන්සේ වැනි ශාස්තෘවරයෙක් ඉපදිච්ච රටක් ඒ ගැන කොච්චර ආඩම්බර වෙන්න ඕනද? ඒත් දඹදිව වඳින්න ඉන්දියාවට ගිය අය දන්නවා ඉන්දියාව බුදුන්ට සලකන්නෙ තුට්ටු දෙකට බව. ධර්මපාලතුමා නොහිටියා නම් බුද්ධගයාව කුත් නැහැ. එහෙනම් හින්දුකාරයො මුස්ලිම්කාරයො ශ්‍රීමහා බෝධිය කපලා දරට අරගෙන හුහක් කල්.

ඕනම රටක ත්‍රස්තවාදියො බෝ වුනා නම් ඒ රටේ ආණ්ඩුවටවත් ජනතාවටවත් යහතින් ඉන්න හම්බ වෙන්නෙ නෑ කියන එක කවුරුත් දන්න දෙයක්. ත්‍රස්තවාදී උවදුරු රාශියක් කාලයක් තිස්සේ තියන ඉන්දියාව කාටත් වඩා ඒක දන්නවා. ඉන්දියාව මහා පාහර වැඩක් කළා. කොටි ත්‍රස්තවාදීන්ට කඳවුරු හදල දීලා උන්ට ඉන්දියන් බුද්ධි අංශය යොදවලා පුහුණු කළා. ඒක ලංකාවෙ මිතුරෙක් කරන වැඩක්ද? ප්‍රභාකරන් අල්ලන්න ඔන්න මෙන්න කියලා තියෙද්දි **1989** දි උඩින් ඇවිත් පරිප්පු දාලා වැඩේ කෑවා. එච්චර විතරක් නෙවෙයි ඉන්දියන් මහකොමසාරිස් දික්සිත් පස්සෙ ලියූ පොතේ සඳහන් වෙනවා, එදා ලංකාව ඒ පරිප්පු දැමීමට විරුද්ධ වුනා නම් ඉන්දියානුගුවන් හමුදාව එදාම කොළඹට පහර දී ලංකා රජයේ නායකයන් ඝාතනය කරන්නටත් සූදානමක් තිබූ බව. සැටලයිට් මගින් කොළඹට පහරදෙන තැන්ද ලකුණු කරගත් බවත් දික්සිත් කියනවා. ඇත්තටම මූන් යාළුවොද? එදා ප්‍රභාකරන් අල්ලලා විනාශ කළා නම් යුද්ධය තව අවුරුදු **16** ක් ඇදෙන්නෙ නෑ. එහෙනම් ජීවිත දහස් ගණනක් විනාශවීම වළක්වා ගන්න තිබුණා. මිතුරෙක් හැටියට පෙන්නලා ඉන්දියාව කොච්චර ද්‍රෝහිකමක්ද ඒ කළේ. විජිතමුණි රෝහණ සිල්වා රජීව් ගාන්ධිට ගහපු රයිපල් බට් පාර මට නම් පවුම් කෝටියක් වටිනවා. අපේ අභිමානය වර්තමාන ලෝකය ඇත්තටම දැකගත්තෙ එදා.

ඉන්දියාව බලන්නෙ ඒ කලාපයේ අයියා වෙන්න. ඉන්දියාවෙන් අහන්නෙ නැතුව අපට වෙන කිසි රටක් එක්ක යාළු මිත්‍රකම් පවත්වන්න වෙළඳ ගණුදෙනු කරන්න බෑ. අපි චීනෙත් එක්ක යාළුය කියලා ඉන්දියාවට තද වෙනවා. කවදාවත් අපේ දියුණුවක් දකින්න ඉන්දියාව කැමති නෑ. අපි ආර්ථික අතින් ශක්තිමත් වෙනවට ලෝකයේ අපේ සම්බන්ධකම් පුළුල් කරගන්නවට උන් කැමති නෑ. අපේ හැමදේකටම වගේ අපේ ත්‍රස්තවාදී ප්‍රශ්නයටත් ඉන්දියාව මුල හිටම අතදාලා වැඩේ කෑවා. ඊට පස්සෙ දැන් කියනවා ඒ ගොල්ල කියන විසඳුම අපේ රටේ ප්‍රශ්නෙට ගේන්නලු. ඒ මොකටද? අපේ ප්‍රශ්න අපට විසඳගන්න ඇහැකි. අපි මොකටද ඉන්දියාවෙන් අහන්නෙ.?

ඉන්දියාව විසාල රටක්. ඒ ප්‍රාන්ත රාජ්‍ය ක්‍රමය එහාට හොඳයි. අප වගේ අල්ලක් විතර රටකට ඒක වැඩක් නෑ. ඔය හදන්නෙ ඊළම වෙන විදියකට ලංකාවට සෙට් කරන්න. කොච්චර නෑ කිව්වත් ඉන්දියාව කැමතියි ලංකාව කෑලිවලට කැඩෙනවා නම්. අපේ රටේ ඉන්න නායකයොත් තේරුම් ගන්න ඕන ඔය 13 වෙනි සංශෝධන කෙහෙල්මල් පැත්තකට විසිකරලා ඔය තියන විදියට ලංකාව පාලනය කරන්න. බාසාවෙ සම තත්වයක් දීලා තියනවා නම්, ආර්ථිකය හා ඉපයීම් කාටත් කරදරයක් නැතුව සමසේ කරගන්න පුළුවන් නම් තවත් මොන සංශෝධනද? ඉන්දියාවට බම්බු ගහගන්න කියලා අහක බලන් ඉන්න එකයි තියෙන්නෙ. මතක තියාගත යුතු මූලිකම දේ මේකයි. ඉන්දියාව අපේ යාලුවෙක් නම් නෙවෙයි. එච්චරයි !

♦ **වෙලේගෙදර රාළ London**